# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

3 ශ්‍රේණිය -බුද්ධ ධර්මය - 2021 ජනවාරි මාසය - 2 වන සතිය

සැකසුම :- බලංගොඩ අධ්‍යාපන කලාපය.
ප්‍රා. ගුරු උපදේශිකා :- මල්ලිකා රත්නායක

1. අපි ගිය සතියෙ පලමු පාඩම ශබ්ද නගා කිව්වා නේද? නැවතත් පාඩම ශබ්ද නගා කියවමු ද?

2. පුංචි දුවේ, පුතේ පුතාල දන්නවද සුද්ධෝදන මහ රජතුමා ගැන තොරතුරු ?

   වැඩිහිටියන්ගෙන් අසා දැන ගන්න.

3. ශබ්ද නගා වගන්ති කියවමු.

   - සුද්දෝදන රජතුමා ඉතා වීර විශිෂ්ඨ රජ කෙනෙකි.
   - එතුමා ඉතා ධාර්මික රජ කෙනෙකි.
   - සුද්ධෝදන රජතුමා යුද්ධ ශිල්ප වලට ඉතා දක්ෂයි.
   - එතුමා අන් අයට හොදින් සවන් දෙයි.
   - බෝසත් පුංචි කුමාරයා ඉපදුනු බව දැනගත් විට රජතුමා ඉතා සතුටට පත් විය.

4. වාචික පිළිතුරු දෙන්න.

   - සිදුහත් කුමාරයාට වාසය කිරීමට පිය රජතුමා සාදා දුන් මාළිගා තුනට කියන නම් වැඩිහිටියන්ගෙන් අසා දැන ගන්න.
   - සිදුහත් කුමාරයා කුඩා කළ හදා වඩා ගත්තේ කවුද?
   - වැඩිහිටියන්න්ගෙන් අසා දැන ගන්න.
   - වප්මගුල් දින සිදුහත් කුමරු වඩන ලද භාවනා කුමක් ද?

5. මෙසේ කීවේ කවුද? පිළිතුරු ලියන්න.
   "පුතුනි, ඔබට මේ මාගේ දෙවන වැදුම"යි.

6. සුද්ධෝදන රජතුමා පිළිබද ඔබ දන්නා දේ වාක්‍ය 2ක් ලියන්න.
   ..........................................................................................................................
   ..........................................................................................................................

"අපි වැඩිහිටියන්ට ගරු කරමු. "

**"හොදයි ආදරණිය දුවේ, පුතේ ඔයාලට තෙරුවන් සරණයි!"**